මතුගම ප්‍රාදේශීය සභාව - **2020**

---

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

මතුගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) ( ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු බව පහත කරුණු අනුව අනාවරණය විය. | | |
| • වර්ෂය සඳහා අතිරික්තය රු.79,856,740 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වර්ෂයේ අතිරික්තය ලෙස වර්ෂයේ විස්තීර්ණ ආදායම වූ රු.79,354,952 ක් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය රු.501,788 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| • අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනානොගත් ප්‍රාග්ධන වියදම් දීමනා රු.81,778,186 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වර්ෂයේ අතිරික්තය සඳහා ගැලපීම් කර නොතිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අත් වැරදීමකින් සිදු වූ දෝෂය පිළි ගන්නා අතර නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| • වර්ෂය තුල තොග වැඩිවීම් වටිනාකම රු.8,142,551 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය තුල අඩුකර දැක්විය යුතු වුවත්, එය රු.676,524 ක් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එකතු කර දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට එකතු කර පෙන්වා ඇති රු.676,524 ක වටිනාකම අඩුකර නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| • වර්ෂය තුලදී වෙනත් ජංගම වත්කම් වල වැඩිවීම රු.140,830,573ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය තුල අඩුකර දැක්විය යුතු වුවත්, එය රු.146,693,211 ක් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එකතු කර දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදිව සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | • කෙටිකාලීන ගෙවිය යුතු දැ වල වර්ෂය තුලදී වැඩිවීම රු.53,774,228 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය තුල එකතු කර දැක්විය යුතු වුවත්, එය රු.40,395,322 ක් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | වැරදි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට එකතු කල රු.40,395,322 නිවැරදි කර වසර තුල කෙටිකාලීනව ගෙවිය යුතු දැවල වැඩිවීම රු.43,190,664 එකතු කර නිවැරදි කිරීමට කටයුතු කරන බව | වැරදි නිවැරදි කළ යුතුය. |
| | • වෙනත් ජංගම වගකීම් යටතේ වර්ෂය තුලදී කෙටිකාලීන ණය ගැනීම් අඩුවීම රු.9,834,512 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය තුල අඩුකර දැක්විය යුතු වුවත්, එය රු.474,842 ක් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එකතු කර දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| | • වර්ෂය තුල දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.22,383,818 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල එය රු.1,207,229 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය රු.21,176,589 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| | • ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.29 ප්‍රකාරව වර්ෂය තුල ජංගම නොවන ආයෝජන වැඩිවීම රු.8,872,374 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල දක්වා නොතිබුණි. | අතපසු වීමකින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සිදු වී ඇති වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| | • ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.30 ප්‍රකාරව වර්ෂයේ ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.81,276,398 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල දක්වා නොතිබුණි. | අතපසු වීමකින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සිදු වී ඇති වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.26 ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ ඉතිරි කිරීම් තැන්පත් වටිනාකම රු.3,973,639 ක් මුදල් හා සමාන දෑ යටතේ දැක්විය යුතු වුවත්, එය ජංගම නොවන ආයෝජන ලෙස දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 6.4 ප්‍රකාරව දේපල පිරියත සහ උපකරණ අයිතමයන් එහි මූලික හඳුනා ගැනීමේදී අස්ථිත්ත්වයක් හඳුනාගත යුත්තේ එහි පිරිවැයටයි. නමුත් 2019 වර්ෂයේ ඉදි කරන ලද කෝපිවත්ත හන්දියේ වැලිපැන්න මාතෘ හා ළමාසායන පැරණි ගොඩනැගිල්ලේ රු.6,852,228 ක පිරිවැය ගිණුම්ගත නොකර රු.4,665,000 ක තක්සේරු | වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදිව සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම ගිණුම්ගත කර තිබුණි. එම නිසා ප්‍රත්‍යාගණන සංචිතයද රු.2,187,228 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 6.4 ප්‍රකාරව මූලිකව හඳුනාගත යුතු ගොඩනැගිලිවල පිරිවැය හඳුනා නොගෙන රු.9,926,429 ක තක්සේරු වටිනාකම ප්‍රත්‍යාගණන අගය ලෙස සඳහන් කර තිබුණි. එම ප්‍රමාණයෙන් ප්‍රත්‍යාගණන ලාභය වැඩියෙන් දක්වා තිබුණි. | පෙන්වා ඇති පරිදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදිව සකස් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.89,334,487 ක් වුවද, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය තුල සමුච්චිත අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂය රු.74,661,011 ක් ලෙස දක්වා තිබුණි. | එම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය තුල 2019 වර්ෂයේ විස්තීර්ණ ආදායම රු.10,305,157 ක් සමුච්චිත අතිරික්තයෙන් අඩු කිරීම නිසා එම ප්‍රමාණයෙන් ස්කන්ධය අඩුවී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමුච්චිත අරමුදල් ගිණුම තුල වර්ෂය සඳහා අතිරික්තය රු.79,856,740 ක් සටහන් කර නොතිබුණු අතර එම වටිනාකම වත්කම් හා වගකීම් ප්‍රකාශය තුල අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනානොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස දක්වා තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් ගැලපිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී හිමිකම් වෙනස්වීම සඳහා බලපාන ලද ප්‍රාග්ධන සංචිත හා ප්‍රත්‍යාගණන සංචිත ගිණුම්වල සිදු වූ විචලනයන් ස්කන්ධය වෙනස්වීමේ ප්රකාශය තුල ඉදිරිපත් කර නොතිබුණි. | අතපසුවීමකින් අත්හැරී තිබූ බැවින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් ගැලපිය යුතුය. |
| (ඉ) | වර්ෂ අවසාන භාණ්ඩ සමීක්ෂණයේදී ආයුර්වේද ඖෂධ තොගය සමීක්ෂණය කර නොතිබූ අතර ආයුර්වේද වෛද්‍ය නිලධාරි වාර්තාව අනුව එම තොග වටිනාකම රු.1,039,552 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2020 භාණ්ඩ සමීක්ෂණයේදී ආයුර්වේද ඖෂධ තොගය සමීක්ෂණයෙන් මඟහැරී ඇති අතර ඉදිරි වර්ෂයේ සමීක්ෂණයේදී ඖෂධ තොගය සමීත්ෂණයට භාජනය කරන බව | භාණ්ඩ සමීක්ෂණය කර තොගය නිවැරදිව හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වර්ෂ අවසාන භාණ්ඩ සමීක්ෂණයේදී ඉවත් කිරිමට හදුනාගෙන තිබූ කාර්යාල උපකරණ සහ ලී බඩු පිළිවෙලින් රු.1,970,990 ක් සහ රු.61,650 ක් අවශ්‍ය අනුමැතියෙන් තොරව ගිණුම්වලින් ඉවත් කර තිබීම නිසා එම වටිනාකමින් කාර්යාල සහ ලී බඩු උපකරණ ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි. | වාර්ෂිත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව භාණ්ඩ හා අදාල වටිනාකම පොත් වලින් ඉවත් කරන බව | විධිමත් ක්‍රමයකට ගිණුම්වල ගැළපීම් සිදු කළ යුතුය. |
| (උ) | කෝපිවත්ත හන්දියේ වැලිපැන්න මාතෘ හා ළමාසායන පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර තිබුණද, රු.1,600,000 ක් වූ එහි වටිනාකම ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | ඉදිරි ගිණුමෙන් නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවලපිටු අංක 37 හි ස්ථාවර වත්කම් උපලේඛනයේ කඩා ඉවත් කරන ලද ගොඩනැගිල්ලේ රු.1,600,000 ක වටිනාකම ඇතුලත්ව ඇත. එය නිවැරදිව ගැලපිය යුතුය. |
| (ඌ) | වත්කම් ප්‍රත්‍යාගණනය නොකර ඒවායේ පැවති ශේෂ ක්ෂය අනුපාත අනුව රු.7,586,395 ක් අඩුකර තිබීම නිසා එම ප්‍රමාණයෙන් ප්‍රත්‍යාගණන සංචිතය අඩු වී තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ප්‍රත්‍යාගණනය සිදුකර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | වත්කම් ප්‍රත්‍යාගණනය හා ගිණුම් තැබීම නිවැරදිව කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 13 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපයෝගි ලේඛන අතර රු.13,214,153 ක වෙනසක් විය. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි නිවැරදි කරන බව | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපලේඛන , ලෙජර් ගිණුම් නොමැතිවීම නිසා එකතුව රු.692,863,579 ක්වූ ගිණුම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරිමට නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | උපලේඛන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.79,856,740 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,363,677 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී සමස්ථ වරිපනම් බදු හිඟය රු.7,290,483 ක් වූ අතර ඉන් වර්ෂ 03 ත් 05 ත් අතර හිඟය රු.1,028,431 ක් ද, වර්ෂ 05 ත් 10 ත් අතර හිඟය රු.735,313 ක් විය. | රු.12,041,998 ක බිල් කිරීමෙන් 2021 මැයි දිනට රු.6,899,928 ක් අයකර ගෙන ඇත. ප්‍රතිශතය සියයට 57.30 කි. තත්ත්වය යහපත් වූ වහාම හිඟය අය කිරීමට කටයුතු කරන බව | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 9,598,756 ක් හා මුද්දර ගාස්තු රු.77,500,000 ක් විය. | පළාත් ආදායම් කොමසාරිස්ගේ ප්‍රමාදය නිසා රු.9,598,756 ක උසාවි දඩ මෙතෙක් ලැබී නැති බව | හිඟය කඩිනමින් අයකර ගත යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අළුතින් ස්ථාපනය කිරීමට යෝජනා කර තිබූ දික්පිට පෙර පාසැල් හා කොස්ලන්ද පෙර පාසැල් සඳහා 2020 මාර්තු 10 දින රු.104,900 ක වියදමක් දරා පෙර පාසැල් උපකරණ මිලදී ගෙන තිබුණත් පෙර පාසැල් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණ අතර , එම පෙර පාසැල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ කටයුතු ද සිදු කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප) 2021 මාර්තු 09 දිනැති අනුමැතිය පරිදි ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරන බව | ගුරුවරු බඳවාගෙන පෙර පාසැල් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |